# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : තාක්ෂණික සහකාර (සිවිල්)**

**තනතුරු සංඛ්‍යාව** : තනතුරු 01

**සුදුසුකම්** : තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 මට්ටමට නොඅඩු වන්නා වූ තාක්ෂණ විද්‍යා සිවිල් පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව හදාරා සමත් වී තිබීම.

සමග

තාක්ෂණ විද්‍යා සිවිල් පිළිබඳව වසර 01 ක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : රු. 50,540 - 10×540 - 07×630 - 04×1,080 - 20×1,280 - 90,270 (මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ)

**වයස් සීමාව** : අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය. (දැනටමත් රාජ්‍ය, සංස්ථා, දෙපාර්තමේන්තුවල සේවයේ නිරත අයට මෙය අදාල නොවේ.)

**02. තනතුර : පාලම් තරාදි ක්‍රියාකරු**

**තනතුරු සංඛ්‍යාව** : තනතුරු 02

**සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ හා ගණිතය යන විෂයන් ඇතුලුව විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

සමග

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම, යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාල අවස්ථාවන්හිදී හදාරා තිබීම)

**වැටුප් පරිමාණය** : රු. 46,220 - 10×540 - 07×630 - 12×1080 - 12×1280 - 84,350 (මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ)

**වයස් සීමාව** : අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය. (දැනටමත් රාජ්‍ය, සංස්ථා, දෙපාර්තමේන්තුවල සේවයේ නිරත අයට මෙය අදාල නොවේ.)

රජයේ අනුමත සියලු දීමනා සංස්ථාව විසින් ගෙවනු ලැබේ.

අයදුම්කරු රාජ්‍ය, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු නම් එම ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතුය.

**ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම සහ ලිපිනයන් සහිතව සම්පූර්ණ කරන ලද අයදුම්පත් "සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, නො.15, රොක්හවුස් පටුමග, කොළඹ - 15."** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මෙම **දැන්වීම පලවී දින 07 ක්** ඇතුළත එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සටහන් කළ යුතුය.

**සභාපති,**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,**
**නො. 15, රොක්හවුස් පටුමග,**
**කොළඹ - 15.**
**2025.05.27**

SELACINE